**පරිසර අමාත්‍යාංශය**

# ජාතික ඕසෝන් ඒකකය

## වියානා සම්මුතියේ 25 වන සංවත්සර තැපැල් මුද්දරය සඳහා පැවැත්වෙන දීප ව්‍යාප්ත පාසැල් චිත්‍ර තරගය

පරිසර අමාත්‍යාංශයේ, ජාතික ඕසෝන් ඒකකය සහ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ මුද්දර කාර්යාංශය ඒකාබද්ධව, නිකුත් කරනු ලබන ඕසෝන් ස්ථරය සුරැකීම සඳහා වූ වියානා සම්මුතියේ 25 වන සංවත්සර තැපැල් මුද්දරය සඳහා යෝග්‍ය චිත්‍රයක් තෝරා ගැනීම පිණිස, දීප ව්‍යාප්ත පාසැල් චිත්‍ර තරගයක් පවත්වනු ලැබේ.

තේමාව : ( ඕසෝන් ස්ථරය සුරැකීම සඳහා වූ වියානා සම්මුතියේ 25 වන සංවත්සරය සමරමු.
(Celebration of 25th Anniversary of Vienna Convention for Ozone Layer Protection)

**තරඟ කොන්දේසි**

01. තේමාවට අනුකූල වන පරිදි දිග 16'' x පළල 12'' ප්‍රමාණයේ වූ කඩදාසියක (කෙන්ට් වර්ගයේ කඩදාසියක් නම් වඩාත් සුදුසුය) නිර්මාණ ඉදිරිපත් කළ යුතුය.

02. අඟල් 1/2 ක තීරුවක් වටේට ඉතිරි වනසේ චිත්‍රය නිර්මාණය කළ යුතුය. චිත්‍රය වර්ණ ගැන්වීම සඳහා දිය සායම්, තෙල් සායම්, පැස්ටල් හෝ කැමති සායම් වර්ගයක් යොදා ගත හැකිය.

03. ඉදිරිපත් කරන චිත්‍රය පිටුපස සිසු/සිසුවියගේ නම, උපන් දිනය, 2010.12.31 දිනට වයස, ලිපිනය, පාසැල සහ ඉගෙනුම ලබන ශ්‍රේණිය ද ඉතා පැහැදිලිව සඳහන් කර, (පරිගණක ගත කිරීම සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් මෙම තොරතුරු සඳහන් කිරීම වඩාත් සුදුසුය) චිත්‍ර තමන්ගේම නිර්මාණයක් බවට තමන් ඉගෙනුම ලබන පාසැලේ විදුහල්පති වෙතින් අත්සන් සහ නිල මුද්‍රාව යොදා සහතික කර ඉදිරිපත් කළ යුතුය.

04. එක් අයෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් නිර්මාණයක් පමණි.

05. විද්වත් විනිශ්චය මණ්ඩලයක් යටතේ චිත්‍ර තේරීම සිදුකරනු ලබන අතර, විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වනු ඇත.

06. තැපැල් මුද්දරය සඳහා තෝරා ගනු ලබන ජයග්‍රාහී චිත්‍රය සඳහා රුපියල් 5000 මුදල් ත්‍යාගයක් සහ සහතිකපතක් පිරිනමනු ලැබේ.

07. තැපැල් මුද්දර සඳහා සුදුසු චිත්‍රයක් තෝරා ගැනීමෙන් පසු ඉතිරි වන අනෙකුත් චිත්‍ර අතුරින් තේමාවට ගැලපෙන සහ කුසලතාවයන් පෙන්වන, පහත වයස් කාණ්ඩයන් යටතේ තෝරා ගන්නා ජයග්‍රාහී නිර්මාණ 9 ක් සඳහා (එක් වයස් කාණ්ඩයකින් 1, 2 හා 3 ස්ථාන ලෙස) මුදල් ත්‍යාග සහ සහතිකපත් සැප්තැම්බර් 16 වෙනිදා ජාත්‍යන්තර ඕසෝන් දිනය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ පවත්වන උත්සවයේ දී ලබා දීමට කටයුතු කරනු ලැබේ.

    අදාළ වයස් කාණ්ඩ 2010. 12. 31 දිනට,
    i. වයස අවුරුදු 11 ට අඩු    ii. වයස අවුරුදු 11 සිට 15 දක්වා    iii. වයස අවුරුදු 15 සිට 18 දක්වා

08. ඔබේ චිත්‍ර නිර්මාණය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි ''තැපැල් මුද්දරය - චිත්‍ර තරගය'' ලෙස සඳහන් කර, භාර ගැනීමේ අවසන් දිනය වන 2010 ජුනි 30 වන දිනට හෝ ඊට පෙර ලැබෙන ලෙස පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම කළ හැකිය.
    **"අධ්‍යක්ෂ, ජාතික ඕසෝන් ඒකකය, නොඃ 980/4, වික්‍රමසිංහ පෙදෙස, ඇතුල් කෝට්ටේ, කෝට්ටේ"**

09. තැපැල් මුද්දරය සඳහා තෝරා ගනු ලබන ජයග්‍රාහී චිත්‍ර නිර්මාණයේ අයිතිය මුද්දර කාර්යාංශය සතුවන අතර අනෙකුත් ජයග්‍රාහී චිත්‍ර නිර්මාණවල අයිතිය ජාතික ඕසෝන් ඒකකය සතුය.

10. ජයග්‍රාහී චිත්‍ර නිර්මාණ හැර ඉතිරි චිත්‍ර අතරින් ඔබේ චිත්‍රය ආපසු ලබා ගැනීමට අවශ්‍ය නම් සැප්තැම්බර් 16 දිනට පසුව ජාතික ඕසෝන් ඒකකයෙන් ලබාගත හැක.

11. ජාතික ඕසෝන් ඒකකයේ සහ මුද්දර කාර්යාංශයේ ලියාපදිංචි නිර්මාණකරුවන්ගේ පවුල්වල සාමාජිකයන්ට මෙම තරගය සඳහා සහභාගි විය නොහැක.

ඉහත සියලු තරඟ කොන්දේසි වලට එකඟව ඔබේ නිර්මාණ එවිය යුතු අතර එම කොන්දේසි වලට අනුකූල නොවන සහ නිර්මාණකරු පිළිබඳ අසම්පූර්ණ තොරතුරු ඇතුලත් නිර්මාණ ප්‍රතික්ෂේප කරන බව කාරුණිකව සලකන්න.

වැඩි විස්තර ජාතික ඕසෝන් ඒකකයේ දුරකථන අංක 011-2883417 ඔස්සේ ලබාගත හැකිවන අතර ඔබට අවශ්‍ය විස්තර පත්‍රිකාද ජාතික ඕසෝන් ඒකකයට පැමිණ ලබාගත හැක.

ලේකම්
පරිසර අමාත්‍යාංශය